# තොරතුරු පත්‍රිකාව

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි/ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව

රැකියාවන්හි වසර දෙකකට වඩා වැඩි සේවා කාලයක් සහිත **2018.01.30** දිනට වයස අවුරුදු 22 ට නොඅඩු රැකියා නියුකතිකයන් සඳහා විශේෂයෙන් සැකසූ අභ්‍යන්තර උපාධිය.

| ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව – වසර 03 |
|---|

**මූලික සුදුසුකම්**

2000 වසරේ සිට පැවැත්වූ අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් විෂයයන් 03ක් **එකවර** සමත් වීම, හෝ 2000 වසරට පෙර පැවැති අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය, විභාගයෙන් විෂයයන් 04ක් **එකවර** සමත් වීම. මෙම අධ්‍යාපන සුදුසුකම ලබා ගැනීමෙන් පසු රාජ්‍ය අංශයේ **හා/හෝ** පෞද්ගලික අංශයේ වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා **දැනටමත් රැකියාවේ නියුතු වීම.**

| ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පාඨමාලාව – වසර 01 |
|---|

**මූලික සුදුසුකම්**

ඉහත සුදුසකම නොමැති අ.පො.ස. (සා.පෙ.) සමතුන්ට ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (වසර 01) සම්පූර්ණ කර ඉහත උපාධි පාඨමාලාවට ඇතුලත් වීමට හැකිය. අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් 06 ක් සම්මාන 03 සහිතව **එකවර** සමත් වීම අවශ්‍ය වේ. මෙම අධ්‍යාපන සුදුසුකම ලබාගැනීමෙන් පසු රාජ්‍ය අංශයේ **හා/හෝ** පෞද්ගලික අංශයේ වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා **දැනටමත් රැකියාවේ නියුතු වීමද** අවශ්‍ය වේ. මීට අමතරව වසර දෙකකට නොඅඩු කාලයක ස්වයං රැකියාවක නියුක්ත වූවන්ද සලකනු ලැබේ. (මේ සඳහා ඩිප්ලෝමා සහතිකයක් නිකුත් නොකෙරේ.)

**තෝරා ගනු ලැබීම**

ඉහත පාඨමාලාවන් සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති රැකියාධාරී අයදුම්කරුවන් ලිඛිත ප්‍රවේශ පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණ මඟින් තෝරා ගනු ලැබේ. පාඨමාලා සඳහා තෝරාගැනීමේ සම්පූර්ණ වගකීම ආයතනය සතු අතර අදාළ සියළුම කරුණු පිළිබඳ අවසාන තීරණය ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව මඟින් ගනු ඇත.

**දේශන පැවැත්වීම**

අභ්‍යන්තර දේශන සෑම සතියකම සඳුදා සිට සිකුරාදා දක්වා පස්වරු 05.00 සිට 7.30 දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේදී පැවැත්වේ.

අවසාන විභාගය සඳහා සුදුසුකම් ලැබීමට අවම වශයෙන් එක් එක් විෂය සඳහා පවත්වනු ලබන දේශණ වලින් 80% කට සහභාගී වීම අත්‍යවශ්‍ය වේ.

අයදුම්කරුවන් සඳහා උපදෙස්

1. ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව හා ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට යටත් වූ විශ්වවිද්‍යාලයන්හි මුදල් අය නොකරන උපාධි පාඨමාලා සඳහා මෙයට කලින් හෝ දැනට ලියාපදිංචි වූ අය සහ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශ්‍රම අධ්‍යාපන පාඨමාලාවේ කුමන හෝ වසරකට දැනට ලියාපදිංචි වී ඇති සිසුනට ඉල්ලුම් කල නොහැක

2. මෙම පාඨමාලාවන් හැදෑරීම සඳහා ඔබගේ පාඨමාලා ගස්තු වලින් වැඩි කොටසක් ශිෂ්‍යත්වයක් ලෙස රජය දරන අතර ඔබගෙන් පහත සඳහන් පරිදි වාර්ෂික ලියාපදිංචි වීමේ ගාස්තුවක් හා ආපසු ගෙවනු ලබන රු. 1000/- ක පුස්තකාල තැන්පතු මුදලක් අයකෙරේ.

**ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව**

- ලියාපදිංචි ගාස්තුව - වසරකට රු. 5000/-
- පරිගණක විද්‍යාගාර ගාස්තුව - වසරකට රු. 2000/-

**ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව**

- ලියාපදිංචි ගාස්තුව - වසරකට රු. 5000/-

3. ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය පිරිනමන්නේ කොළඹ විශ්වවිද්‍යාලය මඟින් වන අතර එය වෙනත් පීඨ සහ ආයතන සමඟ පවත්වන වාර්ෂික අභ්‍යන්තර උපාධි ප්‍රධානෝත්සවයකදී ප්‍රධානය කෙරේ.

4. ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් කිරීමේදී මූලික සුදුසුකම් යටතට අදාල අ.පො.ස. (උ.පෙ.) සුදුසුකම් තිබෙන අයට වඩා ප්‍රමුඛත්වය ලබා දෙනුයේ අ.පො.ස. (සා.පෙ.) සුදුසුකම් ඇති අයට වේ.

<u>අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ලිපි ලේඛණ</u>

1. සේවා ස්ථානයේ ප්‍රධානියාගෙන් ලබාගත් සේවා කාලය දැක්වෙන සහතිකයේ **මුල් පිටපත** (අයදුම්පතට අමුණා එවිය යුතුය)
2. ස්වයං රැකියාවල නියුක්තවූවන් පහත ලේඛන අයදුම්පතට අමුණා එවිය යුතුය
   a. අදාල ව්‍යාපාරය ඉල්ලුම්පත් භාර දීමට නියමිත අවසන් දිනට අවුරුදු දෙකකට පෙර තම නමින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර ඇති බව තහවුරු කරන ලද ලේඛණයේ ජායා පිටපත.
   b. මේ දක්වා එය අඛණ්ඩව පවත්වා ගෙන යන බවට සහතික කර ප්‍රාදේශිය ලේකම්ගේ අනු අත්සන සහිත පළාතේ ග්‍රාමසේවා නිලධාරීගෙන් ලබා ගත් සහතිකයේ මුල් පිටපත.
3. විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් අ.පො.ස. (සා.පෙ.) / අ.පො.ස. (උ.පෙ.) විභාග සහතික වල ජායා පිටපත්. (අයදුම්පතට අමුණා එවිය යුතුය)
4. උප්පැන්න සහතිකයේ ජායා පිටපත. (අයදුම්පතට අමුණා එවිය යුතුය)
5. නම හා ලිපිනය ලියූ රු. 50/- ක මුද්දර ගැසූ 9'' x 4'' ප්‍රමාණයේ ලිපි කවර 03 ක්.
6. අයදුම්පත් ගාස්තු (1000/-) ගෙවූ බැංකුව විසින් සහතික කරන ලද පිටපත,

(ඉහත අංක 02 (a), 03 හා 04 ට අදාළ, සහතික වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කල යුතුවේ)

ඉහත ලිපිලේඛන සමඟ නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2017.01.30 දින හෝ දිනට පෙර සහකාර ලේඛකාධිකාරී (පරිපාලන) මානව සම්පත් අභිවර්ධන ආයතනය, 275, බෞද්ධාලොක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අසම්පූර්ණ හා / හෝ ප්‍රමාද වූ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අධ්‍යක්ෂ
මානව සම්පත් අභිවර්ධන ආයතනය
275, බෞද්ධාලොක මාවත
කොළඹ 07